# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,473 - 2026 ජනවාරි මස 23 සිකුරාදා - 2026.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )



| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 28 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 30 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

27 - B 082757 — - (2026/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

නඩු අංකය : DMB 03/20
ස්වභාවය : උකස්කරය
වටිනාකම : රු.4,675,210.76/-
ඇස්කිසි අංකය : 29/2025

*............පැමිණිලිකරු.*

*එදිරිව*

තුඩුසේන අප්පුහාමිලාගේ සුශාන් තරංග කුලරත්න,
අංක 81, පට්ටියාගම,
පූගොඩ.

*................විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2024 ක් වූ ඔක්තෝබර් මස 29 දිනැති ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය ප්‍රකාරව අප ආයතනය වෙත ගෙවිය යුතු රුපියල් හතළිස් හය ලක්ෂ හැත්තෑ පන් දහස් දෙසිය දහයයි ශත හැත්තෑ හයක (රු. 4,675,210.76/-) මුදලින් කිසිදු මුදලක් ගෙවා නොමැති බැවින් ඒ අනුව එකී ඉතිරි මුදල අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ සඳහන් දේපළට ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට පැමිණිල්ලට අවසර දී ඇති බවට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2025 ක් වූ සැප්තැම්බර් මස 23 දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 06 දින ප. ව. 2.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගගබඩ පත්තුවේ පූගොඩ ප්‍රාදේශීය සභා සහ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පට්ටියගම - 421 ග්‍රාම නිලධාරි වසම තුළ පට්ටියගම ගම පිහිටි "සියඹලාගහවත්ත, හිග්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් මැන සාදන ලද අංක 3915 සහ 2004.09.10 දින දරන පිඹුර ප්‍රකාර ලොට් A සඳහා මායිම්, : උතුරට : යූ. ඩී. ඊ. කරුණානායක හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පී. ප්‍රනාන්දු සහ තවත් අය විසින් හිමිකම් කියන ළිඳමුල කුඹුර ද, දකුණට : ඩබ්ලිව්. එස්. එච්. වික්‍රමසිංහ හිමිකම් කියන ඉඩම ද, බටහිරට : එච්. ජී. රංජිත් සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් පහයි දශම හයයි හයක (අ. 1, පර්. 5.66) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේ ද වේ. (මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 133/46 හි ලියාපදිංචි කර ඇත.)

*මාර්ග පරවශතා අයිතිය :*

පට්ටියගම ගම පිහිටි "සියඹලාගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. ආනන්ද චන්ද්‍රසිරි විසින් මැන සාදන ලද අංක 253 සහ 2007.07.26 දින දරණ පිඹුර ප්‍රකාර ලොට් A2 (අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කරන ලද) සඳහා මායිම් : උතුරට : බී. එස්. අලහකෝන් මැන සාදන ලද පිඹුරු අංක 3915 හි ලොට් A ද, නැගෙනහිරට : ඩබ්ලිව්. එස්. එච්. වික්‍රමසිංහ හිමිකම් කියන කුඹුර ද, දකුණට : පාර සහ දයාවතී හිමිකම් කියන ඉඩම ද, බටහිරට : මෙම ඉඩමේ ම ඉතිරි කොටස ද යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම නවයයි හයක (පර්. 8.96) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 133/47 හි ලියාපදිංචි කර ඇත.)

*ගෙවීමේ ක්‍රමය* :

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැනුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25% ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
පූගොඩ.

වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 09 දින දී ය.

01 - 261

---

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ අස්ගිරිය-බටහිර 134/3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැල්හේන පිහිටි "ඉත්තගලලන්ද හෙවත් ජාපලවත්ත" නැමති ඉඩමට වර්ෂ 1985 දෙසැම්බර් මස 30 දින වී. කදිරවෙලන් ගම්පහ කොට්ඨාසයේ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 931 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 44 දරන ඉඩම.

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.,

*පෙර*

එම්. සී. එස්. එල්. ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ්,

*සහ*

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

*............පැමිණිලිකරු.*

| | | |
|---|---|---|
| නඩු අංකය | : | DMB/189/17 |
| ස්වභාවය | : | උකස්කර |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | රු. 1,794,833/50 |
| ඇස්කිසි අංකය | : | 44/2025 |

*එදිරිව*

1. බෝබුවල දේවගේ චන්දිම ප්‍රසාද් බෝබුවල,
2. කලුහකුරු දේවගේ නන්දිකා ගුණතුංග,

*දෙදෙනාම*

අංක 32/D
මල්වත්ත පාර, අස්ගිරිය බටහිර, ගම්පහ.

*................විත්තිකරුවන්.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව නඩුවේ ඇතුළත් කර ඇති වර්ෂ 2019 ක් වූ ඔක්තෝබර් මස 28 දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු පැමිණිල්ලේ සඳහන් නඩු නිමිත්ත මත,

කාලීන ණය අංක : GMCRTL1300479200 (නව අංක : GMTFTL1303824600) යටතේ 2017.06.30 දිනට රු. 1,794,833.50 ක මුදලක් සහ 2017.07.01 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරනු ලබන තෙක් වාර්ෂිකව 31% බැගින් පොළිය ද සමග අයකර ගැනීම සඳහා මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව පැමිණිලිකරුගේ වාසියට නඩුව තීන්දු කරන ලද හෙයින් ද,

මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තරවන බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ අස්ගිරිය - බටහිර 134/3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැල්හේන පිහිටි "ඉත්තගලලන්ද හෙවත් ජාපලවත්ත" නැමති ඉඩමට වර්ෂ 1985 දෙසැම්බර් මස 30 දින වී. කදිරවේලන් ගම්පහ කොට්ඨාසයේ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 931 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 44 දරන හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි හයක් (0.096) විශාලත්වයෙන් යුත් ඉඩම වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපළ පිළිබඳ වෙන්දේසිය,

**වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 19 දින ප. ව. 1.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය :*

ගම්පහ, උඩුගම්පල, කෙහෙල්බද්දර සිට උග්ගල්බොඩට පැමිණ දකුණට ඇති ප්‍රාබාමින් මීටර් 200 ක් පමණ පැමිණ දකුණට ඇති කන්ද උඩින් නැවතත් දකුණට පැමිණ කොන්ක්‍රීට් පාරේ පැමිණෙන විට වම් පැත්තට වන්නට මෙම දේපළ පිහිටා තිබේ.

*වෙන්දේසියේ ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් කොළඹ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් / නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතුය. සියළුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරවලින් පමණක් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතුය. විකුණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ පිස්කල් ගාස්තු හා රජයේ ගාස්තු ද එම අවස්ථාවේ දී ම මා වෙත ගෙවිය යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ අස්ගිරිය - බටහිර 134/3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැල්හේන පිහිටි "ඉත්තගලලන්ද හෙවත් ජාපලවත්ත" නැමති ඉඩමට වර්ෂ 1985 දෙසැම්බර් මස 30 දින වී. කදිරවේලන් ගම්පහ කොට්ඨාසයේ බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 931 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 44 දරන ඉඩමට මායිම්, උතුරට : කැබලි අංක 40, 41 සහ 43, නැගෙනහිරට : කැබලි අංක 43 සහ 39 (පාරක් සඳහා වෙන් කරන ලද කොටස), දකුණට : කැබලි අංක 44 සහ 40 සහ බටහිරට : කැබලි අංක 40 සහ 39 (පාරක් සඳහා වෙන් කරන ලද කොටස) යන මායිම් තුළ වූ හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි නවයයි හයක් (0.096) විශාලත්වයෙන් යුත් ඉඩම සහ එය තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 298/125 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී පිඹුරු අංක 931 හි සඳහන් සියළුම මාර්ග අයිතීන් ද සමඟ වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
ගම්පහ දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 14 දින,
ගම්පහ දිසා අධිකරණයේ දී ය.

01-340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.